# භව දුක



සංස්කරණය

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.

# අපට උදවු කරන්න



**තිරාන් ඉඳුසර, තිනෙත් ඉරසර, තිමල් ඉරුෂාන් පංචි දඟයන් පසුගිය දිනෙක අපේ කාර්යාලයට පැමිණියේ ඔවුන්ගේ මව්පියන් හා මිත්තණියද සමඟිනි. යන්තම් අවුරුදු දෙක පසුකල මේ නිවුන් දරුවන් තිදෙනාගේ උපන් දිනය යෙදී තිබුණේ ඒයේ දිනටය. අම්මාගේ, තාත්තාගේ හා මිත්තණියගේ අතේ හුරතල් වෙමින් පැමිණි ඔවුන්ගේ දඟකාරකම් නම් නිමක් නෙවීය. එහෙත් මේ දරුවන්ගේ බර දරාගෙන සිටින මාපියන්ට අප හමුවේ කියන්නට කාරණා බොහෝමයක් විය.**

රාගම ඉහළගම පදිංචි නිශ්ශංක හා ප්‍රේමලතාගේ කැදැල්ලට මේ දරුවන් තිදෙනා එක්වන්නේ 2013 මැයි මස දෙවැනිදාය. එතැන් පටන් අද වෙනතුරුත් තම දරු පැටියන් ලොකු මහත් කරගන්නට ඔවුන් විඳි දුක් අපමණය. තමන්ටම කියා නිවසක් නොමැතිව අනුන්ගේ කුලී ගෙයක ජීවත්වන නිශ්ශංකට හරිහමන් රැකියාවක්ද නොමැත. කොතරම් නැති බැරිකම් පැවතියත් තම ලෙයින් ඉපදුණු මේ බිළිඳුන්ට කිසිම අඩුපාඩුවක් නොකරන්නට නිශ්ශංකත් බිරිඳත් කැපවෙන්නේ තම කුසට පවා හරිහැටි අහරක් නොලබමිනි.

මේ දරුවෝ තුන්දෙනා ඉපදුනේ 2013 මැයි මාසේ දෙවැනිදා. දැන් හරියටම අවුරුදු දෙකයි. මට ස්ථිර පදිංචියක් නෑ. අපි ඉන්නේ කුලී ගෙදරක. රියදුරු රස්සාව කරල තමයි කීයක් හරි හම්බ කරන්නේ. ඒ මුදලත් අපිට ජීවත්වෙන්නට කොහෙත්ම ප්‍රමාණවත් නෑ. මගේ මල්ලි මගේ නමට ත්‍රීවිල් එකක් අරන් දීලා තියෙනවා. ඒත් ඉතින් හැමදාම හයර් ලැබෙන්නේ නැහැ. රැකියාවක් හොයාගෙන තැන් කිහිපයකටම ගියත් ඒ කිසිම තැනකින් මට පිළිතුරක් ලැබුණේ නෑ. මෙයාලා ඉපදුණු දවසේ ඉඳන් මගේ බිරිඳත් පුළුවන් ආකාරයට රජයට ගිහින් දැනුම් දුන්නා. මට මොන විදිහක හෝ සහනයක් ලබාදෙන්න කියලා. ඒ ලියුම් ඔක්කොම මගේ ළඟ තියෙනවා. මාධ්‍ය ආයතන කීපයකටත් ගියා. ඒත් ඒ ආයතන වලින් ලියුමක් දෙනවා

අග පිටකවරයට.....

# භව දුක

## අංක : 18

*සංස්කරණය*

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!**

සකල සත්ව සමූහයා කෙරෙහි පතල මහා කරුණාවෙන් දුක්ඛිත සංසාර සාගරයට බැස මෙතෙකැයි කිවනොහැකි එහෙත් ලකුණක් වශයෙන් සතර අසංඛ්‍ය මහා කල්ප ලක්‍ෂයක් වූ අතිදීර්ඝ කාලාන්තරයක් පුරා දානාදි සමතිස් පාරමී ධර්මයන් පුරා සම්‍යක් සම්බෝධි පදප්‍රාප්ත වූ සකල ධර්මයම තත්වාකාරයෙන් ස්වභූ ඥාණයෙන් අවබෝධ කරගෙන ජය ශ්‍රී මහ බෝ මැඩදී දස බිම්බරක් මාරසේනාව පරාජය කර එතැන් පටන් පරිනිර්වාණය දක්වා මතු පන්දහසක් අවුරුදු ශාසනය අහසේ බැබලෙන පූර්ණ චන්ද්‍ර දිව්‍යරාජයා සේ පරම්පරා පණහකට අධික ප්‍රමාණයක් මෙතෙකැයි කිව නොහැකි දෙවියන්, බඹුන් සහිත සකල සත්ව සමූහයාට සතර අපා දුක්ඛයන්ගෙන් මිදී ස්වර්ග මෝක්‍ෂ සම්පත් ලබාගැනීමේ මාර්ගය පෙන්වා වදාළ එම තථාගතයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

ඉපදීම දුකකි, ඉපදුනදා සිට තම උවමනාවන් මවට කීමට කථා කිරීමට හැකිවෙන තෙක් දුකකි. ස්වශක්තියෙන් මුණින් අතට පෙරළී, බඩගාමින් යමින්, වැටි වැටි ඇවිදීම පුහුණු වන තෙක් දුකකි. ඉන්පසු ප්‍රියයන්ගෙන් වෙන්වී පාසැලට ඇතුලත් වීම දුකකි. පාසැලට යාම, ආපසු ඒම දුකකි. ආහාර පාන අවශ්‍ය ආකාරයට නැතිවීම දුකකි. අපිරිසිදු මිල අධික ශරීරයට අහිතකර ආහාර පාන ගැනීම දුකකි. තරගයන්ගෙන් පැරදීම දුකකි. දිනීම පසුවට දුකකි. ඔය අතර නොදැනුවත්වම පාප මිතුරු ඇසුරට වැටීම දුකකි.

අධ්‍යාපනයෙන් පසුව රැකියාව ගැන දුකකි. ලැබෙන රැකියාව පරලොව වශයෙන් දුගති ආත්ම භාවයන්ට යොමුවීමක් වුවොත් එයද දුකකි. මෙලොව වශයෙන් තවකවදය, උසස් අයගේ ඇනුම්, බැනුම්, කෙණෙහිලිකම් ඇතිවීම දුකකි. තමා ඇති දැඩි කල දෙමාපියන්ට උපස්ථාන කිරීමට නොලැබීම දුකකි. විවේකයක් නැතිකම දුකකි. ඥාතිමිත්‍රාදීන්ගේ

නොයෙකුත් කටයුතු සඳහා වියදම් කිරීමට සහභාගිවීමට වීම දුකකි. කෙසේ නමුත් දැන් කලවයසත් රැකියාවත් තිබෙන නිසා විවාහයක් වීමට කැමැත්තෙන් හෝ අකමැත්තෙන් දෙමාපිය ඥාතීන්ගේ ඉල්ලීම පිට හෝ සිදුවීමද දුකකි.

ඉපදීමේ දුකට එකතුවූ ඉහත සඳහන් දුක් කන්දරාවට අමතරව විවාහ ජීවිතයට පත්වීම ගිහි ගෙය ගිනිගෙයක් බවට පත්වීම දුකකි. විවාහ ජීවිතයෙන් පසු දරුඵල ලැබීම තවත් දුකකි. නොලැබීමත් දුකකි. (සිද්ධාර්ථ කුමාරයා චක්‍රවර්ති රාජ සම්පත් තිබියදීත් ලැබුණු එකම පුත්‍ර රත්නය ගැනත් පැවසුවේ ''තවත් රාහු අපලයක් '' කියා) එය එසේනම් වර්තමානයේ තිබෙන ''**අන්තෝ ජටා බහි ජටා**'' ''ඇතුලටත් කරදර පිට තවත් කරදර'' තිබෙන සාමාන්‍ය අය ගැන කවර කථාද? ඇති හැකි අය දරුවන් වෙනුවෙන් මාන්නය ඉතිරිකර ගැනීම සඳහා වැඩි වැඩියෙන් ධනය සෙවීම සඳහා කරන කියන පාප කර්මයන් නිසා අන්‍යයන්ට දෙන පීඩාදිය වෙනුවෙන් මිනිසත් ලොවේ, තිරිසන් අපායේ, ප්‍රේත අපායේ තිබෙන අධික දුක් කන්දරාවට වඩා මහත් දුක් දෙන අටමහ නිරයට නොදැනුවත්වම වැටීම මහත්ම දුකකි. එසේ වීමට ආසන්නම හේතු වයෝවෘද්ධ භාවයට පත්වන තම දෙමාපියන් මුණුපුරු මිණිපිරයන් රැකබලා ගන්නා සේවක සේවිකාවන් බවට පත්වීමේ අහේතුව නිසාය. ඔවුන්ටද සීල, භාවනා කටයුතු කරගෙන පරලොවට යමක් කර ගැනීමේ වාසනාවක් නොමැති කමත් දුකකි. ඔවුන්ගෙත් පින් මඳ කමකි. මේ පිළිබඳව ලෝවැඩ සඟරාවේ සඳහන් 121 කවිය..

පින් මිස නෑයන් වන පිහිටක් නැත
උන්ගෙන් මට හිමිවන දෙයකුත් නැත
මින් මතු අඳහා සිහිකරතොත් සත
අන් කුසලයක් නොකලත් මෙමෙ දේ ඇත

<u>එහි තේරුම</u> කුසල් මිස නෑයන්ගෙන් වන පිහිටක් නැත. නෑයන්ගෙන් මට අයිති වන දෙයකුත් නැත. මින්පසු සත්වයා මේ බව විශ්වාස කොට සිහිකළහොත් වෙනත් පිණක් නොකලත් මෙම කරුණම ප්‍රමාණවත්ය.

69 වන කවිය..

මුන් හැම අඹු දරුවන් උපදි ත්තේ
පින් බලයෙන් බෝකල් පවති ත්තේ
උන්කල පිනමය උන් රඳවන් ත්තේ
ඉන් සිත ලෝබමය තොප පවති ත්තේ

<u>එහි තේරුම</u> අඹු දරු ආදි සැමදෙන උපදින්නෙත්, ඔවුන් බොහෝ කල් ජීවත් වන්නෙත් පින්බලය හේතු කොට ගෙනය. ඔවුන් බොහෝ කල් මෙහි රැඳෙන්නේ ඔවුන්ගේ පින්බලය හේතු කොට ගෙනය. එබැවින් නුඹගේ සිත් තුල ආසාවක්මය (තෘෂ්ණාව)

දුක් ගෙන රැස්කර දන හැම කැමතී
නික්මෙන නිරයට නරයින් සිටිතී
දුක් දෙන අඹු දරුවන් නිති රකිතී
මොක්දෙන පිරිසිදු සිල් නොම රකිතී

<u>එහි තේරුම</u> දුක් මහන්සියෙන් කැමති සෑම ධනයම රැස්කර නිරයට යන මනුෂ්‍යයෝ සිරිතක් වශයෙන් දුක් දෙන්නාවූ අඹු දරුවන් නිරන්තරයෙන් රකිති. නිවන් සැප ලඟාකර පිරිසිදු වූ සිල් නොකරති.

ලෝවැඩ සඟරාවේ මෙම කවි තුනෙන් සහ එහි තේරුම් තුනෙන් පෙන්වා දෙන්නේ අඹුදරුවන් අනාථ කොට, අතරමන් කොට තපසට යාම කියනවා නොව, ''පණින්නට පෙර සිතා බලනු'' කියන්නා සේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශයටම දෙන උතුම් පණිවිඩය වර්ථමාන කාලයේ (පාපය බලවත්) විවාහ ජීවිතයෙන් වෙන් වීමත්, බ්‍රහ්මචාරී ජීවිතයකට හුරුපුරුදු වීමත් නිති පන්සිල්, අටසිල් එකක් හෝ බිඳනොගෙන කොපමණ ආර්ථික අපහසුතා තිබුණත් ඒවා විඳ දරාගෙන නුසුදුසු වෙළදාම්, කර්මාන්තාදියෙන් වැළකී දාන, ශීල, භාවනාදියෙහි යෙදෙමින් පඤ්චකාම වස්තූන් කෙරෙහි නොඇලී සිල්ගුණ වඩාගත්තොත් අනිවාර්‍යයෙන්ම තාවකාලික සදිව්‍යලෝක සම්පත්තියක් නොව, ස්ථිර වශයෙන්ම පඤ්චකාම වස්තූන්

පිළිකුල් කරන්නේ නම් මහා කල්ප ගණන් ආයුෂ තිබෙන බ්‍රහ්ම ලෝකවලට යාමටවත් අවශ්‍ය නැතිව පහතින්ම තිබෙන බ්‍රහ්ම ලෝක තුනවන බ්‍රහ්ම පාරිසජ්ජ, බ්‍රහ්ම පුරෝහිත, මහා බ්‍රහ්ම ලෝකයක උත්පත්තියක් ගතහොත් එම ආත්ම භාවයෙහින්ම ස්ත්‍රී ආත්ම භාවයෙන් මිදීමත් සමගම එම ආත්ම භාවයෙහිදීම මතුලෝ පහළවන භාග්‍යවත්, අරිහත්, මෛත්‍රී සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශාසනය පවත්නා කාලය තුලදීම මෙතෙක් අප පසුකර පැමිණි අති භයානක දුක් ගමන එවන්ම ආකාරයට මතු භවයකට නොගෙන සදා සැප ඇති නිවණට පත්වෙමින් සසර ගමන නිමා වන්නේය. එය මනාව සක්සුදක් සේ පැහැදිලිය.

දැන් පෘතග්ජන අයගේ සිතට මෙවන් අදහසක් පහළ වන සේක. ''මේ හාමුදුරුවෝ කියනවා දාන, ශීල, භාවනා වඩන්න'' කියා අපි ජීවත් වන්නේ වේලක් ඇර වේලක් මොනවා හරි සොයා ගෙන එහෙව් අපි දන් දෙන්නේ කොහොමද? සිල් රකින්නේ කොහොමද? භාවනා කරන්න ඔළුව එකලස් වෙන්න එපාය, අපිට මේ තියෙන ප්‍රශ්න වලට ඔළුව ගිනි අරන් තිබෙන්නේ හාමුදුරුවෝ නම් නිකම ඉඳගෙන බණ කියාවි, අපිට තිබෙන ප්‍රශ්න දන්නේ අප පමණයි'' කියා.

භවනාව වශයෙන් මෙසේ සිතන්න. අද අපි ඇයි මේ තත්වයට පත්ව තිබෙන්නේ කොහොමද? (හාමුදුරුවොත් පැවදි වෙන්නට කළින් සිටියේ ඔබලා අද සිටින තත්වයෙන්, පැවිදි වූවාට පසු පැමිණි චිත්ත පීඩා, කායික පීඩා ගිහි කාලයේ සිටියාටත් වඩා දුකයි. නමුත් මම දැන් වයස අවුරුදු 75 ක් පසුකරගෙන යන්නේ සෑම දුක් කරදයක්ම පාරමිතාවක් බවට පත්කර ගත්තා. අප්‍රමාණ කුසල් රැස්කර ගත්තා, බොහෝ දෙනාට යහපත පිණිසත්, ආදර්ශමත් ආකාරයටත් වැඩකරගෙන යන්නේ මේ ලියන මොහොතෙත් මා පසු වන්නේ අනුන්ගේ අණසකට යටත්ව අගුල් පිළකයි. පෙර භවයේ කරගෙන තිබෙන කුසල් බලයෙන්, දුර්ලභ මනුෂ්‍ය ආත්මයක්, එයටත් වඩා දුර්ලභ සම්බුද්ධ ශාසනයත්, එයටත් වඩා දුර්ලභ සම්බුද්ධ ශාසනය පිහිටාධාර කරගෙන සසර ගමන කෙටිකර ගැනීමේ මාර්ගය අවබෝධ කරගෙන ඒ අනුව ඉදිරි ගමන අවසානය දක්වාම ජය කණුව

වෙතට යාම තනියම නොව තවත් විශාල පිරිසකට මෙවන් ධර්ම ග්‍රන්ථ මාර්ගය ප්‍රදාන කොටගෙන මේ වන විට දහම් ග්‍රන්ථ 17 ක් කළඑළි දක්වා තිබේ.

සීලය වශයෙන් සිතන්න සිත, කය, වචනය හැකි තරම් සන්වර කරගෙන, බොරු කීම්, කේළම් කීම්, පරුෂ වචන කීම්, හිස් වචන කීම් වලින් තොරව අනුන්ට යහපතක් වන ආකාරයට වචන පාවිච්චි කරන්න. මෙකී කාරණා වලදී පින්වතුන් පමණක් නොව මෙය ලියන මමත් යන ගමන යන්නේ වැටි වැටී ළදරුවන් ඇවිදින්නට උත්සහා ගන්නා ආකාරයට සිල් බිඳෙනවා, කැඩෙනවා, මාර බලවේග, මිනිස් වෙසින් සිටින පහත් අමුනුෂ්‍ය බලවේග නිරන්තරයෙන් අපයන ගමනට බාධා කරනවා. එය දූන වැරදි නිවරදි කරගන්න උත්සහා ගන්න.

දානය ගැන කියන්ට තිබෙන්නේ මුදල්ම තිබිය යුතු නෑ. ශ්‍රමදානය, අභය දානය, ධර්ම දානයත් දානයකි. අපමහ බෝසතාණන් වහන්සේ සසර පාරමී භූමියේදී සාවකු වී ඉපදී දන් දුන් ආකාරය සිහිපත් කරන්න. එසේම අනේපිඩු සිටුතුමා අපමණ ධනස්කන්දයක් වියදම් කර සාදන ලද ජේතවනාරාමය සාදා බුදුපාමොක් සංඝයාට පූජා කර ලබාගත් කුසලට සමාන කුසලක් රැස්කර ගත්තේ එක ගඩොල් කැටයක්වත් පූජා කරන්න. වත්කමක් නොමැති දුගී මනුෂ්‍යයෙකි. එසේම විශාඛා උපාසිකාව විසින් පණස් හතර කෝටි තුනක් වියදම්කර පූජා කරන ලද පූර්වාරාම පිණට සමාන පිනක් ලබා ගත්තේ එතුමියගේ සේවිකාවකි. තව තවත් අටුවා ටීකා අවශ්‍ය වන්නේ නැත. පසුබට නොවන්න.

මෙතෙක් පෙන්වා දුන්නේ භවදුකෙන් කොටසකි. එම කොටස තුලම භව දුකෙන් මිදෙන ආකාරයත් පෙන්වා ඇත. මිනිසත් භාවයේ තවත් දුක්විඳින කොට්ඨාශයක් වූ ස්ත්‍රීන්ටද ස්ත්‍රී ආත්ම භාවයෙන් පමණක් නොව සම්පූර්ණ සසර ගමණින් මිදිමේ මාර්ගයත් එමගින් පෙන්වා ඇත. තවත් කොටසක් මෙතැන් සිට කියවා තේරුම් ගන්න. එනම්

රජයේ රැකියාවක් කරන්නෙකු නම් තමා ගන්නා වැටුපට, වරප්‍රසාදයට, විශ්‍රාම වැටුපට සරිළන සේවයක් කර නැත්නම් එයද පරලොව වශයෙන් අනුන්ට ණය ගෙවීමට සිදු වීම දුකකි. අල්ලස්, දූෂණ, වංචා, නිළතල, බලතල අයුතු ලෙස කලානම් ණය ගෙවීමට පෙර අටමහ නිරයන්හිද, ප්‍රේත අපායෙහිද, අනන්ත අප්‍රමාණ කාලාන්තරයක් දැඩි ලෙස වේදනා විඳීම දුකකි. ණය ගෙවීමට සිදුවන්නේ ඉන් අනතුරුව උපදින තිරිසන් අපායෙහිදීත්, ඉන් අනතුරුව ලබාගන්නාවූ මිනිසත් ආත්ම භාවයෙහිදීය. සඟ සතු දේ අයුතු ලෙස කෑම, මහජන දේපල හොරා කෑම ආදියෙහි විපාක සර්පයන්ගේ පැවැත්ම සඳහා ගිළින බිත්තර පැටව්, මීයෝ, ගෙම්බෝ ආහාර වශයෙන් ගෙනි ජීවත්වීම වැනිය.

මෙයාකාරයට ඉපදුන දා සිට විඳවපු දුක් වේදනාවන්ට අමතරව මුලින් පෙන්වා දුන් ප්‍රියයන්ගෙන් වෙන්වීමත් අප්‍රියන් හා එක් වීමත් නිසා වන දුක්වලට අමතරව දුකසේ මහත් බලාපොරොත්තු සහිතව එක්රැස් කල ධනට, නිවාස, අඹුදරුවන් තමන්ට අහිත කරවද, අකීකරුවද, සොර, සතුරු උපද්‍රවයන්ගෙන් වන පීඩාදියද දුක් ගොඩකි.

මෙම දහම් ග්‍රන්තයට එකතු කරන ලද දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවේ පෙන්වා වදාළ ''මේ කුණු පඤ්චස්කන්දයම දුක් ගොඩක්'' යයි අපගේ බුදුපියාණන් වහන්සේ පෙන්වා වදාළ කරුණු කාරනා එකින් එක විස්තරාතමකව වෙන වෙනම ඇතුලත් නොකට එහි පෙන්වා වදාළ කාරණා දෙකක් සහ අපගේ මතකයෙන් ඉවත්වෙන්නට ඉඩ නොදී එයත් අහෝ සසර දුකකි. අහෝ සසර භියයි කියන මෑත කාලීනව සිදුවූ කාරණා 14 ක් සහ ජාතක කථා වස්තුවක් ඇතුලත් විස්තරයක් සටහන් කරමි.

එනම් දම්සක් සූත්‍ර දේශනාවේ පෙන්වා වදාල

**''මහණෙනි, මේ ලෝකයෙහි සත්වයන් විසින් අත්හැරිය යුතු කරුණු දෙකක් නම් අත්තකිලමතානු යෝගය සහ කාම සුඛල්ලිකානු යෝගයද අත්හැරිය යුතු එම කරුණු දෙකම සත්වයාට අහිත පිණිස, දුක පිණිස, නිරයගාමී වීම පිණිස පවතින නිසා මේ දෙකෙන්ම වෙන්වී මධ්‍යම ප්‍රති**

**පදාවෙන් යුතුව වාසය කළ යුතුය.**

මෙයින් පෙන්වා දෙන්නේ කාම සුඛල්ලිකානු යෝගයේ අනිටු විපාක

1. ඉරාණයේ හිටපු 'ෂා' රජතුමා විඳි කාමසුඛල්ලිකානු යෝගය රටේ ජනතාව සතු තෙල් සම්පත තමා සතු බූදලයක් ලෙස සිතා ක්‍රියා කිරීමේ අනිටු විපාකයක් ලෙස එම රටේ පැන නැගුන විප්ලවය නිසා ජීවිතයේ අග භාගයේ තමාගේ කාම සුඛල්ලිකානු යෝගී රාජ්‍ය නොව, එතුමා භාරගැනීමටවත් කිසිම රාජ්‍යයක් ඉදිරි පත්වූයේ නැත. අවසානයේ අමෙරිකාවේ බලපෑම මත මිසරයේ නවාතැන් ගෙන එහිම ආගන්තුකයෙකු ලෙස අවසන් හුස්ම හෙළීය. මෙයද භව දුකකි.

2. ඉරාකයේ හිටපු ජනාධිපති සදාම් හුසෙන් ජනාධිපතිතුමාට වූ දෙය වර්තමාන සමාජයේ මතකින් ඈත් නූනත් එතුමාගේ කාම සුඛල්ලිකානු යෝගය නිසා පුතුන් දෙදෙනාද රට වැසියන් ලක්ෂ ගණනින් ද මරණයට පත්කරවමින් එදා විශාල මහ නුවර තත්වයට පත්ව තිබෙන්නේ.

3. ලිබියාවේ ගඩාපි ජනාධිපතිතුමාටද එම රාජ්‍යයටද සිදුවූ විනාශය සිහියට ගන්න.

4. ලෝකයේ පුදුම හතෙන් එකක් වූ ඉන්දියාවේ ටාජ්මහල් මන්දිරය කරවූ 'ෂාජහන්' රජතුමාට ධන සම්පත්, පරිවාර සම්පත් වලින් සැපත් විඳින්න ලැබුණාද? මේවා වර්තමානයේ රජවරු, පාලකයින් ආදර්ශයට ගනිත්වා, පස්වැනි කාරණයත් ටාජ්මහල් කථාවට අදාළ පන්සිය පණස් ජාතකයෙහි සඳහන් කථා වස්තුවකි, එයත් කියවා බලන්න

5. යටගිය දවස අපමහ බෝසථානන් වහන්සේ පොතලී නුවර මහාධන සම්පත් හිමි කුලයක ඉපදී තරුණ වියට පත්වූ කල තම දෙමාපියන් මළ පසු එම ධනය දන්දී ගිහිගෙයි දුක දැක හිමාල වනයෙහි තපස්දම් රකිමින් ධ්‍යාන සම්පත් ලබා සිටිසේක. ඒ සමයෙහි එම රාජධානියෙහි 'අස්සක'

නම් රජකෙනෙක් දසරාජ ධර්මයෙන් රාජ්‍ය කරන සමයෙහි රජතුමාගේ අග බිසව බෙහෙවින් ඉතා අලංකාර රූප සම්පත්තියකින් බැබළුනේය. වරක් දුටුවෙකු නැවත නැවත බලන තරමේ රූප ශෝභාවයකින් යුක්ත විය.

ඒ නිසාම ෂාජහන් රජතුමා මෙන්ම මෙතුමාද තමාගේ එකම වස්තුව ලෙස බිසවට ආදරය කලාය. මේ අතර කලක් යාමේදී සිරිමා නගර ශෝභනී මෙන්ද, මුම්ටාෂ් රජ බිසව මෙන්ද, අස්සප රජතුමාගේ අග බිසව වූ උබ්බරී බිසව අභාධයක් නිසා මිය ගියේය. රජතුමාට මෙය දරා ගත නොහැකි දුකක්ම විය. ෂාජහන් රජතුමා මෙන්ම මෙතුමාද බලවත් අසහනයට පත්ව නොකා නොබී උමතුවෙන් මෙන් දවස් හතක්ම තම යහන ළඟ බෙහෙත් ඔරුවක ප්‍රිය බිරිඳගේ ශරීරය තබා ගෙන හඬමින් සිටින අතර, අපමහා බෝසත් තාපසතුමා එක් දිනක් අළුයම් වේලෙහි ලෝකය දෙස බලන අතර මෙම රජතුමා පත්ව තිබෙන තත්වය දැක මම මෙතුමාට පිහිට වෙමියි සිතා අහසින් වැඩම කර රජතුමාගේ උයනෙහි බැබළෙමින් සිටි සේක.

මෙය දුටු ඒ අසලින් ගමන්ගත් රජතුමාට හිතයිෂි රාජපුරුෂයෙක් තාපසතුමා වෙත ගොස් වැඳ එකත්පස්ව සිටියේය. එවිට තාපසතුමා ''ඔබගේ රජතුමා හොඳින් රට පාලනය කරනවාදැයි ''ඇසීය. ''එසේය ස්වාමිනී, බොහොම ධාර්මිකව රට පාලනය කරන අතර එතුමාගේ අග බිසව අදට දින හතකට පෙර මිය ගොස් ඒ දුකට රජතුමා නොකා නොබී බොහෝ සෙයින් දුකසේ සිටින නිසා ඔබ වහන්සේට හැකිනම් රජතුමාගේ දුක නිවා දෙන සේක්වා'' යි අයැද සිටියේය. එවිට තපස්තුමා ''රජතුමාගේ හිත සනසන්නට මට පුළුවනි. එතුමා නාදුනන නිසා මාළිගාවට නොඑමි. මෙහි පැමිණියොත් එසේ කරමි'' යි වදාළ සේක.

එවිට හිතයිෂී පුරුෂයා තාපසතුමාට වැඳ ''මම රජතුමා මෙහි කැඳවාගෙනි එමි. ඔබවහන්සේ මා කෙරෙහිත්, රජතුමා කෙරෙහිත් අනුකම්පාවෙන් අප ආපසු එනතෙක් ඉවසන සේක්වා'' යි කියා රාජ මාළිගයට ගොස් එපවත් සැළ කලහ. එවිට රජතුමා මගේ දේවිය ඉපදී ඉන්නතැන දන්නවානම් තවත් ප්‍රමාද නොවී එතුමා වෙත යමු'' යි කියා

රථයකට නැග තාපසතුමා වෙත් ගොස් ඔබවහන්සේ මාගේ දේවිය ඉපදී සිටින තැන දන්වදූයි විමසීය.

''එසේය, මහ රජතුමනි, එතුමිය මේ වනවිට ගොම පණුවෙක් වී සිටියි'' කී විට රජතුමා එය පිළිනොගෙන ''මාගේ අග බිසව තරම් රූප ශොභා සම්පන්න ස්ත්‍රී රත්නයක් මෙම රාජ්‍යයෙහිම නොසිටි කොට ඇය ගොම පණුවෙක් යයි කීම මම පිළි නොගන්නෙමි'' යී කීහ. ''එසේ නම් රජතුමනි, එතුමිය මෙතනට ගෙන්වා ඔබතුමා සමඟ කථා කරවා පෙන්නුවොත් පිළිගන්නේහි'' ද, ''එසේනම් පිළිගනිමි'' යි කීහ. ඉන්පසු තපාස්වරතුමාගේ අධිෂ්ඨාන බලය නිසා එතනට ගොම ගුලි දෙකක් පෙරලි පෙරලි ආවේය. එවිට තාපසතුමා ''උම්බරිය තිගේ වත ගොත පවසව'' යි කීහ.

'' ස්වාමිනී, මට මෙම ආත්ම භාවයට පෙර ආත්ම භාවයෙහි මෙහි සිටින අස්සප රජතුමාගේ අග බිසව වන උබ්බරි දේවිය වෙමි. මමත් මේ රජතුමාත් මෙම උයනෙහි බොහෝ සෙයින් සතුටු වෙමින් උයන් කෙළිමින් කාලය ගත කළෙමියි'' යි කීහ. දූන් තෙපි රජතුමාට ආදර ගෞරවයක් නැද්දූයි'' ඇසීය. එවිට ඇය පවසන්නේ ''තාපසතුමනි, දූන් රජතුමාත් මමත් කුල ගෝත්‍ර දෙකක නිසා රජතුමාගෙන් මට ඇති කාර්යයක් නැත. මේ මාගේ පෙම්වතා'' පවසා පිරිමි ගොම පණුවා වැළඳ ගත්තේය. එවිට රජතුමා මහත් කළ කිරීමට පත්ව මාළිගාවේ සිරියහන් ගබඩාවේ තැන්පත් කර තිබූ මළසිරුර ඉවත්කර පිරිසිදු කිරීමට නියම කළේය.

ඉන්පසු තාපසතුමාගෙන් මෙසේ වීමට හේතුව විමසීය. ''මහරජතුමනි, යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් පෙර ආත්ම භාවයෙහිදී රැස්කර ගත්තාවූ කුසල් අකුසල් මෙලොව දුක සැප පිණිස භුක්ති විඳින්නේය. මෙම බිසවද පෙර ආත්ම භාවයන්හිදි කරගෙන තිබුනාවූ දාන, සීල, භාවනාදි හේතුවෙන් මිනිසත් ආත්ම භාවයක් ලැබීමටත්, අන්‍යයන්ට ඊර්ෂ්‍යා නොකිරීම, ද්වේශ නොකරීම හේතු බලයෙන්, මහත් රූප ශෝභාවන් රජ කෙනෙකුගේ අග බිසව් තනතුරු ලැබීමටත් හේතු වාසනාව උදාවිය.

ඒ නමුත් එම ආත්ම භාවයෙහිදී තමාගේ රූප ශෝභාව නිසා මහත් ආඩම්බරයට පත්ව කිසිම පුණ්‍යකර්මයක් කර නොගත් නිසා තිරිසන් ආත්මයේ උත්පත්තිය ලැබීය. පඤ්චශීලයෙහි සිල්පද කඩනොකල නිසා නිරයේ හෝ ප්‍රේත අපායෙහි නොඉපදුනි, එමනිසා තම තමන් ගැන පමණක් නොසිතා අන්‍යසත්වයන් කෙරෙහිද මෛත්‍රී සිත උපදවා අන්‍යසත්වයන්ද යහමගට ගනිමින් පුණ්‍ය ක්‍රියාවන්හි යෙදිය යුතුය සහ නොපැහැදුනු අයගේ පැහැදීම පිණිසත් පැහැදුනු අයගේ පැහැදීම වර්ධනය වීම පිණිසත් ආදර්ශමත් වන්නැයි වදාරා රජතුමාට අවවාදානු සාසනා කර අහසින්ම හිමාල වනයට වැඩියේ අපගේ ගෞතම බෝසතාණන් වහන්සේමය. එතැන් පටන් රජතුමා තව තවත් දැහැමිව රාජ්‍ය පාලනය කරමින් කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහ.

**මාතෘකාවට අදාලව ධර්ම ග්‍රන්ථයක් සම්පූර්ණ වීමට මෙතෙකින් ප්‍රමාණවත් නොවන නිසා තවත් එවැනිම කථා වස්තුවකින් පසු පසුවදන් ඇතුලත් කර නිමා කරමි.**

**එනම්**

## <u>රට්ඨපාල සූත්‍රය</u>

තුන්ලෝකාග්‍ර අපගේ සම්බුදු රජාණන් වහන්සේගෙන් පැවිද්ද සහ උපසම්පදවා ලබාගත් මෙම රහතන් වහන්සේගේ දෙමාපියෝ අප්‍රමාණ වස්තු සම්භාර හිමි යුවලකි. මේ දෙදෙනාටම සිටියේ මෙම පුත්‍ර රත්නයක් පමණයි.

බුදුරජාණන් වහන්සේගේ ධර්මය අසා මහත් සේ පැහැදුණු මෙම කුමරු බුදුරජාණන් වහන්සේගෙන් පැවිදි භාවය ඉල්ලීමේදී, දෙමාපිය අවසරය රැගෙන එන ලෙසයි. පසුව දෙමාපිය අවසරය ලබා ගොස් පැවිදි වී නොබෝ දිනකින් සියළුම සංසාර බන්ධනයන්ගෙන් මිදී රහත් භාවයට පත්වූ සේක. ඉන්පසු බුදුරජාණන් වහන්සේ වැඩ අවසර ලැබෙතොත් දෙමාපියන් බැලීමට යාමට කැමති බැව් දන්වා සිටි සේක.

එවිට බුදුරජාණන් වහන්සේ තෙරුන් වහන්සේගේ ඉල්ලීම ගැන දිවසින් බලා එමඟින් බොහෝ දෙනෙකුට යහපතක් වන බන දූන ''රට්ඨපාලය, ඔබේ කැමැත්ත සිදුවේවා'' යි වදාළ සේක.

ඉන්පසු රට්ඨපාල තෙරුන් වහන්සේ බුදුරජාණන් වහන්සේ වැඳ නමස්කාර කරගෙන පාත්‍රය සිවුරු රැගෙන ගමට වැඩ රජතුමාගේ උයනෙහි නැවතුනහ. පසුදින ගෙපිළිවලින් පිණ්ඩපාතයෙහි හැසිරෙන කල තම දෙමාපියන්ගේ ගෙදරටද ගෙපිළිවෙලින් වැඩම කල සේක. එය දුටු තම පියා පුතා හඳුනාගැනීමට නොහැකිව, මේ මුඩු මහණුන් නිසා මගේ එකම පුතාවත් අපට ආරක්ෂාකර ගන්න බැරිවුනා කියා නිග්‍රහ කරමින් හිස පීරමින් සිටින අතර සිටු මැදුරේ සේවිකාවක් පිළුණු වූ පිට්ටුවක් කුණු ගොඩට දැමීමට ගෙන ගිය අතර එම ඉවත දමන පිට්ටුව තෙරුන් වහන්සේ ගත් අතර සේවිකාව මෙතුමා හඳුනාගෙන ගොස් ඒ බැව් දෙමාපියන්ට දන්වා සිටියේය.

ඒ සැණින් රහතන් වහන්සේ වැඩ සිටි ස්ථානයට දෙමාපියන් ගොස් හඳුනාගැනීමට නොහැකි වීමත් ආහාරපාන සඳහා නිවස තුලට පැමිණෙන ලෙසත් ඉල්ලා සිටි අවස්ථාවේ අදට මෙපමණකින් සෑහිමට පත්වන බවත් හෙට දානය සඳහා වඩින බවත් දන්වා ආපසු වැඩම කර පසුදින තම දෙමාපියන්ගේ නිවසට වැඩවදාරා දන් වළඳා අවසානයේ මෙසේ ධර්ම දේශනා කළ සේක.

''පින්වත්නි, අස්ථිරවූ මහා වනයක් බඳුවූ ඇටකටු වලින් ආවරණය කර ඇති රෝගයක් බඳු සැවොම රැවටෙන නොයෙකුත් විලාසිතා වලින් රත්තරන් වලින් සැරසූ මෙම දුගඳ හමන කුණු ශරීරිය තේරුම් ගන්න. බිලී කොක්කේ ඇමුණු ඇමට රැවටෙන මත්ෂ්‍යයින් වාගේ මහත් ධන සම්පත් වැය කර පෙන්වන මෙම දෙතිස් කුණපස දිනෙන් දින ජරාවටත් රෝගාබාධයන්ටත්, මරණයටත්, ලක්වන්නේය. එය ප්‍රඥාව නොහොත් නුවණ, නොහොත් පිණ ඇති තැනැත්තා තේරුම්ගෙන දැලෙන් මාළුවා මිදෙන්නා සේ නිවණ වෙත ලංවේ. මාරයා සුසුම් හෙළයි.'' මෙසේ ධර්ම දේශනාව අවසන් කර හුනස්නෙන් නැගිට නැවත රජතුමාගේ

උයනට වැඩි සේක.

උයන් පාලකයා රජතුමාට එබැව් දැන්වූ පසු රජතුමා උයණට පැමිණ තෙරුන් වහන්සේ වෙත ගොස් වැඳ එකත්පසක සිට මෙසේ විමසීය. '' ස්වාමීනි, රට්ඨපාල තෙරුන් වහන්ස, පිරිහීම් හතරක් නිසා මේ ලෝකයෙහි ඇතැමෙක් ගිහිගෙයින් නික්ම පැවදි වෙති.''

''මහ රජතුමනි, ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ පෙන්වා වදාළ කරුණු හතරක් නිසා මම පැවදි වුනෙමි ඒ කිනම් කාරනයද හොත් (1) මෙලෝ සත්වයන් ජරා, මරණ දෙක උරුමකරගෙන ජීවත් වෙති. එයින් ගැලවීමක් නැත. (2) කිසිම සත්වයෙකුට ආරක්ෂාවක් පිහිටක් නැත. (37 කිසිම සත්වයෙකුට තමා සතු කිසිවක් නැත. සියල්ල හැර දමා යා යුතුයි. (4) මෙලෝ සත්වයන්ට කිසිම සෑහීමක්, තෘප්තියක් නොමැත. සර්‍වඥයන් වහන්සේ වදාළ මෙම ධර්මපද සතර අසා මම පැවදි වුනෙමි'' මහ රජතුමනි, ඔබතුමාගේ තරුණ කාලයෙහි තිබුණ කාය ශක්තිය අද තිබෙනවාද?

''ස්වාමීනි, මාගේ තරුණ කාලයෙහි තිබුණු කාය ශක්තිය නැති උනාට අපගේ ආරක්ෂාව පිණිස සෑම ආකාරයෙන්ම ආරක්ෂාක විධි විධාන තිබියදී, ආරක්ෂාවක් ගැන කියන්නේ කෙසේද? '' ''මහ රජතුමනි, ඔබතුමාට මරණාසන්න රෝගයක් හටගත් කල ඔබගේ ආරක්ෂකයින් එයින් ඔබතුමා ගලවා ගන්නවාද? නොඑසේනම්, ඔවුන් එම දුක් වේදනාව භාරගන්නවාද?'' ''නැත, ස්වාමීනි, මමම එම දුක විඳිමි. එසේනම් රජතුමනි, ආරක්ෂාවක් නැත කීවේ එම නිසයි.''මහ රජතුමනි, (3) දැන් ඔබතුමා නොයෙක් පඤ්චකාම සම්පත් භුක්ති විඳ මිය පරලොව ගියාට පසු එම කාම වස්තූන් භුක්ති විඳිනවාද ?, නැත්නම් වෙනත් අය ඒවා භුක්ති විඳිනවාද ? කිසිවක් නැත කීවේ එම නිසයි.

(4) ලෝ වැසියා සෑහිමකට, තෘප්තියකට නොපැමිණෙන්නේ කීවේ, ඔබතුමාට මේසා විශාල වස්තු කන්දරවාක් සහ රාජ්‍යයක් තිබියදී එයින් සෑහීමකට පත් වෙනවාද ? ලෝකයේ ධනවත්

මිනිසුන් ඇත. ඔවුන් අධික මාන්නයෙන් මුලා වී සිටී. අනුන්ට කිසිවක් නොදෙති. දෙන දෙයක් දෙන්නෙත් අධික මාන්නයෙන් නම ඉස්මතු කර ගන්න. කැපී පෙනෙන්න. යටි අරමුණු ඉටුකර ගැනීමට, දන් පින් කරගන්නේ තව තව භව තෘෂ්ණාව ඇති කර ගෙනයි. මරණය ඉක්මන් වීමටත් වස්තුව බලපායි. ඇති හැකි අයද, දුප්පතුන්ද, නූගතුන්ද, නුවණැත්තෝද, පොළොවේ උපන් සියළු සත්වයෝද මරණයට පත් වෙයි. මෝඩයෝ දුක්වෙති. ඥාණවන්තයෝ කම්පා නොවෙති. ඥාණය ලබා ගැනීම සඳහා අකුසලයෙන් මිදී කුසල් රැස්කර ගත යුතුයය. මේ ලෝකයෙහි ප්‍රඥාවෙහි උතුම්බව යනු රහත් ඵලයයි. එය ධනයට වඩා උතුම්ය.

කෙලෙස් සහිත පුද්ගලයා භවයෙහි ඇලීමෙන් මුලාවට පත්ව පව් රැස්කර ගනියි. ඔහු නැවත, නැවත මව්කුස උපදියි. නැවත නැවත මරණයට පත්වේ. කම්සැප විසිතුරු මිහිරි සිත් සතුටු කරවන දෙයක්යයි අනුවණ තැනැත්තා සළකනු ලබයි. මම එහි භිය දැක පැවිදි උනෙමි. බාල, තරුණ, මහළු කවුරුත් ගස්වල ගෙඩි මෙන් ගිලිහී මරණයට පත් වෙති. ''මහ රජතුමනි, මම මෙය අවබෝධ කරගෙන පැවිදි වූයෙමි. ශ්‍රමණ භාවය නොවරදින මාර්ගයයි'' යී මෙසේ වදාළ සේක.

## විද්‍යා සිසුවිය දූෂණය කර මරා දැමීමේ සිද්ධිය
### (25.05.2015 ලංකාදීප)

සමූහ දූෂණයට ලක්වී අනේකවිද දුක් වේදනා මැද ඝාතනය වූ සිලෝනාදන් විද්‍යා (18) නමැති පාසල් සිසුවියගේ මව ශිවලෝගනාදන් සරස්වතී වූවාය.

මොවුන් පදිංචිව සිටියේ කයිට්ස් පොලිස් වසමට අයත් පුන්තුඩතිව් දහවන කොටසේය. අල්ලපු ගෙදරට කෙනෙක් රිංගා වටිනා බඩු බාහිරාදිය සොරාගෙන යනු දුටු සරස්වතී ඒ ගැන පොලිසියට ප්‍රකාශයක් ලබාදී ඇති අතර බඩු සොරාගත් පුද්ගලයාට කාලයක් රිමාන්ඩ් බන්ධනාගාරයේ තපින්නට සිදුවිය.

රිමාන්ඩ් බන්ධනාගාරයේ සිට අධිකරණයෙන් ඇප ලබා පැමිණි මොහු සරස්වතීගෙන් පලිගැනීමට ක්‍රමයක් සොයමින් සිට ඇති අතර ඒ පලිගැනීමට ඇයට විතරක් නොව පවුලේ අනිත් අයටත් හොඳින් දැනෙන එකක්විය යුතුයැයි කල්පනා කර විද්‍යා පැහැරගෙන ගොස් ඝාතනය කිරීමට ඔහුගේ මිතුරකුට කොන්ත්‍රාත්තුවක් ලබාදී ඇත.

විද්‍යා පැහැරගෙන ගොස් ඝාතනය කිරීමට කොන්ත්‍රාත්තුව ලබාදුන් පුද්ගලයා පමණක් නොව ඔහුගේ සහෝදරයන් දෙදෙනා ද මේ සඳහා සහාය ලබාදී ඇති බව හෙළිවීමෙන් ඒ සියළුදෙනාම කයිට්ස් පොලිසිය මගින් අත්අඩංගුවට ගනු ලැබීය.

අපිට තරහකාරයෝ කිසි කෙනෙක් හිටියේ නැහැ. ඒත් මම හොරකමක් ගැන සාක්කියක් දුන්නා. හොරකම කරපු ඒ මිනිහා දුව මරාදාපු එකට සැකයි යැයි විද්‍යාගේ මව පොලිස් නිලධාරීන් සමග ඉකිගසා හඬා වැටෙමින් කීවාය.

විද්‍යාගේ අම්මා මට විරුද්ධව හොරකමක් ගැන සාක්කි දෙනවා. මේ නඩුවෙන් මාව අමාරුවේ වැටෙනවා. මට හිරේ යන්න වෙනවා. ඒ හින්දා සරස්වතීගෙන් පළිගන්න තමා මෙහෙම  දෙයක් කලේ.  විද්‍යා මරා දැමීමට

කොන්ත්‍රාත්තුව දුන් බව කියන පුද්ගලයා පොලිසියට පාපොච්චාරණය කර ඇත. මොවුන් තිදෙනා අත්අඩංගුවට ගනු ලැබුවේ කයිට්ස් පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කුවින්ටස් පෙරේරා මහතා ප්‍රධාන පොලිස් කණ්ඩායමක් විසිනි.

සිලෝගනාදන් විද්‍යා නමැති පාසල් සිසුවියගේ පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වනු ලැබුවේ යාපනය රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී යූ. මයුරන් මහතාය. පාසල් සිසුවිය සමූහ දූෂණයට ලක්වී ඇති බවත් එසේම ඇයගේ හිස යමක තදින් වැදී ඇති බවත් සඳහන් කරමින් පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව නිකුත් කර ඇත.

විද්‍යා දූෂණය කර කෲර ලෙස ඝාතනය කළ බව කියන පාපතරයින් පස්දෙනෙක් අත්අඩංගුවට ගත්තේ පුන්කුඩතිව් පොලිස් ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක පී.එම්. හිරාන් මහතා ප්‍රධාන පොලිස් කණ්ඩායමක් විසිනි. සිසුවිය දූෂණය කර ඝාතනය කිරීමට හවුල් වූ තවත් අයෙක් වැල්ලවත්ත ප්‍රදේශයේ නවාතැන් පොළක ලැගුම්ගෙන සිටියදී අත්අඩංගුවට ගත් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක සහකාර පොලිස් අධිකාරි නීතිඥ රුවන් ගුණසේකර මහතා පවසයි.

ස්විස්ටර්ලන්තයේ අරක්කැමියෙක් ලෙස මෙම සැකකරු රැකියාවක් කරන බවද සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා කීය. කයිට්සි ප්‍රදේශයේ පදිංචිකරුවකු වන මොහු කෙටි නිවාඩුවක් ගත කිරීමට පැමිණි සිටි අවස්ථාවේ මෙම අපරාධය කිරීමට හවුල් වී ඇති බව පොලිස් පරීක්ෂණ වලින් හෙළිවී ඇත. සෙසු අය විද්‍යා වරින් වර දූෂණය කරද්දී මෙම සැකකරු ඒවා වීඩියෝ කර ඇති බවට තොරතුරු පොලිසියට ලැබී තිබේ. මොහු කොළඹට පලා ගොස් සිට ඇත්තේ යළිත් ස්විස්ටර්ලන්තයට පලායාමේ අරමුණ ඇතිවය. පසුව සකකරුව විද්‍යා දූෂණය කර ඇති බවද පොලිස් පරීක්ෂණ වලින් අනාවරණය කර ගෙන ඇත. මේ වැඩේට යන්න කලින් අපි අරක්කු බෝතල් ගෙනත් බිව්වා. අරක්කු බිව්ව නිසා අපි කට්ටිය හිටියේ හොඳටම වෙරි වෙලා. සරස්වතීගේ කෙල්ල ඉස්කෝලේ යන්න එනකම් මග රැකලා හිටියා. එතකොට කෙල්ල බයිසිකලේ නැගලා ඉස්කෝලේ යන්න එනවා දැක්කා. පැනපු ගමන්

කෙල්ලව අල්ලා ගත්තා. කෙල්ල අනේ එපා කියලා කෑගහන්න පටන්ගත්තා. අපි කෙල්ලව අරගෙන කැලෑවකට අරන් ගියා. කෙල්ල අපෙන් බේරිලා යන්න උත්සහ කළා. නමුත් වැඩක් වුනේ නැහැ. කෙල්ලව නිකම්ම මරලා දාන්නේ නැතිව දූෂණය කරලා මරන්න ඕනෑ කියා කල්පනා කළා යැයි අත්අඩංගුවට ගත් සැකකරුවන් පොලිසියට පාපොච්චාරණය කර ඇති බව දැනගැනීමට ඇත.

පොලිස් නිලධාරීන් හමුවේ තවදුරටත් පාපොච්චාරණයක යෙදෙමින් සැකකරුවන් මෙසේද පවසා ඇති බව කියති.

කෙල්ලට දඟලන්න බැරිවෙන විදිහට ගස්වල තබා ගැට ගැසුවා. කෑගහන නිසා ඇය ඇඳගෙන සිටි යට කලිසම කටට එබුවා. යට කලිසම කටේ ඔබන්න හදද්දී අනේ මට කරදර කරන්න එපා. මම මොන වරදක් කළාටද මෙහෙම කරන්නේ අනේ මාමේ මට යන්න දෙන්න කියා ඇය බෙරිහන් දුන්නා. ඇයගේ අඳෝනා අපි ගණන් ගත්තේ නැහැ. අරක්කු බීලා හිටිය නිසා අපි හිටියේ වෙරි මරගාතේ. උදේ 7.45 විතර ඉඳලා දවල් 11.30 විතර වෙනකම් අපි කෙල්ලව මාරුවෙන් මාරුවට දූෂණය කලා. කෙල්ල මැරිලා කියා තේරුණා. ඊට පස්සේ අපි ඇය ඇඳගෙන හිටය ඉස්කෝලේ ඇඳුම ඇයගේ ඇඟ උඩට දාලා කැලෑවෙන් එළියට ආවා.

සරස්වතී එයාගේ ඉස්කෝලේ ගිය දුව ගෙදර ආවේ නැහැ කියා හොයන්න පටන් ගත්තා. ගමේ හුඟක් කට්ටිය ඇය හොයන්න පටන් ගත්තා. අපිත් ගමේ අය එක්ක එකතුවෙලා ඇය හෙව්වා. සිරුර හොයා ගත්තේ පසුවදා පොලිසියේ මහත්වරු ඇවිත්. අපිත් මළ ගෙදර ගිහින් හැමදේකටම උදව් කලා. එහෙම කලේ අපි ගැන කිසිම කෙනෙකුට සැකයක් ඇති නොවෙන්න. සරස්වතීගේ දුවගේ සිරුර තැන්පත් කර තිබූ මිනී පෙට්ටිය ළඟට ගිහින් දේහයට වැද නමස්කාර පවා කලා. මේ අපරාධය ගැන පවුලේ අයට කණගාටුව ප්‍රකාශ කලා. මේ හැමදෙයක්ම අපි කලේ අපි ගැන සැකයක් ඇති නොවෙන්න. ඒත වැඩක් වුනේ නැහැ. යැයි සැකකරුවන් පොලිසියට පාපොච්චාරණය කරමින් තවදුරටත් පවසා ඇතැයිද පැවසේ.

පස් පව් කොට මෙතනත් ලැබ සෝ කය
ගොස් නිරයේ දුක් විඳිති අනේ කය
රැස්කොට ඉන් පිං මෙ මිනිස් ලෝ කය
සිස් නොකරව් කලකින් ලත් මේ කය

පස්පවු, දස අකුසල් නොකටයුතු වෙළඳාම් ආදියෙන් තම තමන්ගේ මඩිතර කර නොගෙන පුණ්‍ය ජීවිත සඳහා යොමු වන්න.

එසේම මෙසේත් සිතන්න, අස්සජි රජතුමා ධාර්මික පාලකයෙකු වූ නිසා එදා බෝසත් තාපසතුමාගේ දර්ශනයට ලක්වී තම ජීවිතේ ඉදිරි කාලය තව තවත් ධාර්මික වී මරණින් මතු සුගතිගාමී විය. එසේම ධාර්මික රජකෙනෙකුගේ අග බිසවක්ද සසර පුරද්ද අනුව නිරයට හෝ ප්‍රේත අපායට නොවැටී දින ගණනකට දෙපලගේම තිබුණු රූප මාන්නයත් එම ආත්ම භාවයෙහිදී කුසල් දහම් කර නොගැනීමත් නිසා මල්ලිකා බිසව මෙන් දින ගණනකින් පසුව පෙර පුණ්‍ය බලයෙන් බෝසත් තාපසතුමාට වන්දනාමාන කිරීමත්, ගෞරවාන්විතව අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු දීමත් නිසා බොහෝ සෙයින් නැවත සුගතිගාමී වීමට ඉඩ තිබේ.

ඒ කථාවට සමාන ඉන්දියාවේ ටාජ්මහල් සිහිවටන අදටත් ප්‍රේමණීය ශෝකයක් උපදවන සිහිවටනයකි. මෝගල් අධිරාජයා විසින් කරන ලද ප්‍රාණඝාත බෞද්ධ වස්තු කොල්ලකෑම, එම පුදුම හතෙන් එක සෑදුව ආචාර්යයා පවා තවත් මෙවන් දෙයක් කලොත් කියන භයට ඔහුගේ ඇස් අන්ධ කිරීම ආදී දේ අනුව බලන කල රජතුමාට මරණින් මතු ලැබුණු ආත්මය ගැන කාට කියන්න පුළුවන්ද? මුම්ටාස් බිසව ගැනත් එසේම අපට සිතන්නට වෙනවා. අස්සජි රජතුමාට ලැබුණු ධර්ම දායාදය සේම, රට්ඨපාල රහතන් වහන්සේ නිසා එම රජතුමාටත් සසර දුක, භිය, අනිත්‍ය අවබෝධය කර ගැනීමට ලැබීමත් යහපත් ගුණධර්ම වලින් සම්පූර්ණ මිතුරු ඇසුරු නිසාමයි. එසේම ධර්ම ග්‍රන්ථයේ අවසානයට එකතු කර තිබෙන පාසැල් දරියකගේ අනුවේදණීය පුවත ගැනත් යමක් සඳහන් කල යුතු නිසා පහත සඳහන් කරමි.

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!**

# නොනවතින වෛරය සහ පළිගැනීම

ඉහත සඳහන් පාසැල් ශිෂ්‍යාවගේ දුඃඛිත ඉරණම සහ 1983 ඇති උනාවූ කලු ජූලිය වෙනුවෙන් දෑස් වලින් නොව හදවතින් දුක්වූ සිංහල බෞද්ධයෝ මේ රටට ලක්ෂ ගණනින් ඌහ. ඒ අතර එම සිද්ධීන් දෙකම දේශපාලන වාසි තකාද, බුද්ධාගමට නිගා කිරීම සඳහාද ආයුධයක් කරගත් අයත් එකී පාසැල් සිසුවියට කිසිම හිතක් පපුවක් නැතිව එම අපරාධය කරපු අයද අවමඟුල් කටයුතු සඳහාද මිනියට ගෞරව කිරීමද සිදුකල අයමෙන් අවස්ථාවාදී සෑම කොටසකටම අයත් සිටීම පුදුමයක් නොවේ. එය පෘතග්ජන සත්ව පරම්පරාවේ පැවත ඒමයි. මෙම පොත මූලිකව සංස්කරණය කරනු ලැවුයේ ක්‍රිස්තු වර්ෂ 2012 අවුරුද්දෙයි. නමුත් මුද්‍රණයට යොමු කිරීමේ භාග්‍ය ලැබුනේ 2015 අවුරුද්දෙයි. එහි ''භව දුක'' යනුවෙන් සඳහන් නම මෙකී පාසැල් සිසුවියගෙන් මනාව ඔප්පු වෙයි.

එසේම එම සිද්ධිය ත්‍රිවිධ හමුදාවෙන් හෝ පොලිසියේ තුන් හතර දෙනෙකුගෙන් සිදුවූවා නම් මුළු ලොව පුරා ඇතිවන තත්වය සහ සිංහල බෞද්ධයාට කරන තාඩන පීඩන නින්දා අපහාස කොතෙක්ද? එයත් මෙහි මුලින් සඳහන් කල ආකාරයට එම සිසුවියට සිදුවූ ඉරණම වෙනුවෙන් යටි සිතින් පටු වාසි නොතකා සතුටු වන අය වෙති.

එසේම ලෝකයෙහිම දරුණුතම ත්‍රස්තවාදී සංවිධානයක් වූ L.T.T. සංවිධානය සමඟ ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය ක්‍රියා කල මානුෂීය යුධ මෙහෙයුම්ය. ඒ නියම සිංහල බෞද්ධයාගේ තිබෙන බෞද්ධ ගතියයි. එය ඉතිහාසයෙන් පෙන්වනවානම්, L.T.T. එක්ටත් වඩා දරුණු බ්‍රිතාන්‍යය එදා සිංහල බෞද්ධයාට විරුද්ධව ආයුධ සමඟ එවූ හමුදාව පෙරලා එම ආයුධ සහ හමුදාව අපට විරුද්ධව ක්‍රියා කරන බව දූන දූනත් පුරන් අප්පු වීරයා ආයුධත් සමඟ සේනාව ආපසු පිටත් කර යැවූයේ බෞද්ධ සිරිත් විරිත් අනුවය.

එසේම එදා සුනාමි අවස්ථාවේත් විශේෂ කාර්යය බලකාය සුනාමියට අසුවූ L.T.T. හතුරන් බේරා ගත්තේ ඔවුන්ට සැළකුවේ කිසිම රාජ්‍යයක නොකරන උපස්ථානයි. එසේම යුද්ධය නිමාවන කාලයෙහි පණ භයින් හමුදාව වෙත භාර වූ දෙමල ජනයාට ඇප උපස්ථාන කරපු හමුදා භටයන් කෙරෙහි තිබුණු භය සැක වෙනුවට ඇතිවූ අසීමිත සතුට ඔවුන් විසින් ප්‍රකාශ කරන ලදී.

ඉතිහාසයේ තවත් ඈතට යනවානම් එදා දුටුගැමුණු එළාර යුද්ධයෙන් පසු සැකෙන් භියෙන් ජීවත්වූ දෙමල ජනතාව ආරක්ෂා කලේ විශේෂ සහනවල් ලබාදුන්නේ දුටුගැමුණු රජතුමාගේ අනුදැනුම උඩ එළාර සොහොනට පවා ගරු කෙරුවේ නියම සිංහල බෞද්ධකම නිසයි. මෙම නොනවතින වෛරය සහ පළිගැනීම (හිංදු බෞද්ධ) නැවත පෝෂණය කරමින් තව තවත් ඉදිරියට ගෙන යන්නේ බ්‍රිතාන්‍ය රජයයි. මේ අවස්ථාවේදී අමෙරිකාව එදා අපේ මිත්‍රයෙක් වශයෙන් ක්‍රියා කලත් (සර් හෙන්රි ඕල්කට්තුමා සහ මියුසියස් මැතිණිය ප්‍රමුඛ) අද සිංහල බෞද්ධයාට විරුද්ධව ක්‍රියා කරන්නේ මහා බ්‍රිතාන්‍යයේ වහලෙක් වී සිටින නිසයි.

දැන් අපගේ අවධානය යොමු විය යුත්තේ එකී පසැල් ශිෂ්‍යාවට වූ විපත ගැනයි. උතුරේ ජනතාවට අසීමිත සේවයක් සහ ආරක්ෂාවක් ලබාදෙන ත්‍රිවිධ හමුදාවත්, පොලිසියත් අවස්ථාවාදී L.T.T. රූකඩ සහ බ්‍රිතාන්‍ය ගැති ආත්මාර්ථකාමි, අවස්ථාවාදී දේශපාලන නඩයකගේ උවමනාව පිට හමුදාව කඳවුරු තුල ගාල් කිරීමත්, පොලිසියට ද්වේශ කිරීමත් නිසාය. එම ශිෂ්‍යාවට එකී අකරතැබ්බය වූයේ හද්ද පාලු ස්ථානයක වීමත්, පාලු නිවසක් වීමත් නිසාය. එකී අවස්ථාවාදීන්ට උවමනා වී තිබෙන්නේ රටේ ආරක්ෂාවට තිබෙන කඳවුරු ඉවත් කිරීමත්, ඒ භූමි තුල මිනිසුන් පදිංචි කිරීමත් සිංහල බෞද්ධයන්ට ඉඩක් කඩක් නොදීමත්ය. එහි අනිටු විපාක තමයි ඔවැනි බරපතල අපරාධයක් නිසා ප්‍රසිද්ධියට පත්වූවත් තවත් ඔවැනි අකටයුතුකම් වන ඒවායේ වගකීමක් එම අවස්ථාවාදීන් විසින්ම භාරගත යුතුයි.

එසේම මානුෂිකව ක්‍රියා කල සහ අපරාධකරුවන් සුළු කාලයක් ඇතුලත අත්අඩංගුවට ගත් පොලිස් නිලධාරීන්ගෙනුත් පළිගත්තේය. එයින් සිදුවන්නේ මින් ඉදිරියට ඔවුන්ගෙන් වන සේවය ආරක්ෂාව අඩුවන විට එකී දේශපාලකයින්ගේ අතකොළු බවට සිටින එකී අපරාධකරුවන් තව තවත් බලවත් වීමයි. ආරක්ෂාව පිරිහීමයි. බ්‍රිතාන්‍ය සතුටු කිරීමයි. ජය ලලිතා ප්‍රධාන තමිල් නාඩු L.T.T. ගැත්තන්ගේ අරමුණු ඉෂ්ටකර දීම සහ සිංහල දෙමල වෛරය පෝෂණය කිරීම ආදී රට අස්ථාවර කිරීමයි.

එසේම බුදු දහම අනුව බලන කල එකී පාසැල් සිසුවියගේ යට කලිසම කටේ ඔබා අමු තිරිසනුන් නව දෙනෙකු ඉතා පිළිකුලෙන් මරණය දක්වාත් මරනෙන් පසුවත් උදේ 7.45 සිට 11.30 දක්වා වරින් වර දූෂණයට ලක්වීම සහ ජීවත්ව සිටින දෙමාපියන්ට අසීමිත දුක් ගින්දරක් සහ ලෝකයාට අහෝ සසර දුකයි, අහෝ සසර භියයි, සසරින් මිදීමම සැපයි. මේ සසර මුලක් අගක් නොපෙනෙන ගමනක යන අපට පෙර භවය හෝ මරණින් පසු ලැබෙන භවය නොපෙනෙන නිසා මාළුවා ඇමට රැවටෙන්නා සේ ප්‍රධාන පාපමිත්‍රයා වූ සුරාව (අරක්කු) නිසා එකී පාපතරයින් සහ එම දේ වීඩියෝ කරගෙන ලැබූ මානසික සුවයක් සහ දේශපාලකයින් එසේම නොයෙකුත් ආකාරයෙන් මානසික තෘප්තියක් ලැබූ ආකාරයට මෙකී සිසුවියත් පෙර මහා කල්ප අසංඛ්‍ය ගනනකට එහා මෙහා හෝ කර ගෙන තිබෙන එවන් අකුසල පාප කර්මයකට දායාද වීමෙන් ස්ත්‍රී ආත්මයක් ලබා මරා දැමීමට කොන්ත්‍රාත්තුව ගත් අයට දූෂණය කිරීමේ චේතනාවක් නොතිබුණත් පාප කර්ම අකුශලය විසින් භවයේ තිබුණු අකුසල විපාකයත් හේතු විය.

මෙය අප සෑම කෙනෙකුටම පොදු ධර්මතාවයකි. මෙය අටමහ නිරයන්ගෙන් ලැබෙන දඬුවම් උපමා කලොත් මේ ආත්ම භාවය වශයෙන් බැලුවොත් මෙලොව සතියක සිරදඬුවමක් හෝ මුදලින් රු. 25/ ක දඩයක් වශයෙනි. පරලොව වශයෙන් අවුරුදු වශයෙන් කිවනොහැකි කල්ප වශයෙන් අටමහ නිරයන්හි විඳවන දුක් කන්දරාව මෙතෙක් කාලයකැයි කිවහැක්කේ බුදුරජාණන් වහන්සේ නමකට පමණයි. එයින් මිදී තිරිසන් අපායේ විඳවන කාල නියමයක්ද නැත. නැවත කවදා නමුත් මිනිසත් භාවයක් ලදත් ස්ත්‍රී පුරුෂ ආත්මයක් නම් ලැබෙන්නේම නැත. ලැබෙන

නපුංශක, පණ්ඩව ආත්ම යන්හිදීත් මෝඩයෝ, අංගවිකල උප්පත්ති ගෙන නැවතත් මෙම ආත්මයේ වාගේම නිරයගාමී වීම තමයි සිදුවන්නේ. විය සිදුරෙන් කැස්බෑවා අහස බලනවාටත් වඩා දුර්ලභ බුදුසසුනක් ලද කලක මොනයම් ආකාරයක පිණක් කරගැනීමට ලදොත් ඉන්පසු තමයි සසර දුකින් මිදීමට ලැබෙන්නේ.

එම නිසා තමයි මහා කල්ප ලක්‍ෂ කෝටි, ප්‍රකෝටි ගණන් ගෙවී ගියත් බුද්ධ කියන වචන මාත්‍රයකුදු අසන්ට නොලැබීම මහා කල්ප අසංඛ්‍ය ගණන් ගෙවුන පසු බුදුරජාණන් වහන්සේ නමක් ලෝ පහළ වන්නේ. එය ලෝකයේ පවතින ධර්මයට ඉඳුරාම වෙනස් මඟ කියා දී පුරුද්දට යන ගමන වෙනස්කර නුපුරුදු මාර්ගයකට සත්වයන් යොමු කර එමඟින් යම් ප්‍රමාණයක සත්ව සංහතියක් සමඟ තමන් වහන්සේද, තමන් වහන්සේ සමඟ පැමිණි පරිවාර සත්ව සන්හතියද සමඟ නිවන් පුරයට වඩින්නේ.

එම නිසා බුදු දහම හොඳින් තේරුම් ගෙන බුදු දහමෙන් පෙන්වා දෙන චතුරාර්‍ය්‍ය සත්‍ය අවබෝධ කරගෙන අනෙකුත් ආගම්, දර්ශන වලින් වෙනස් මාර්ගයක ගමන් කිරීමට උපදෙස් දෙන්නේ ඒ කිසිම ආගමක, දර්ශනයක නැවත ඉපදීම නැති කිරීමට මාර්ගයක් නැති නිසාත්, නැවත භව ගමන නැති කිරීමට යොමු කරවන දර්ශනයක් බුදුදහම තුල තිබෙන නිසා පෙන්වන නිසා බුදු දහමට විරුද්ධ බලවේග ක්‍රියාත්මක වන්නේ එය තේරුම් ගෙන මිථ්‍යාදෘෂ්ටියෙන් මිදී සම්‍යක් මාර්ගය තෝරා ගෙන තම තම නැණ පමණින් අවබෝධ කරගෙන බුදු දහමට එරෙහිකම් නොකරන්න. මහා බ්‍රිතාන්‍යයත් ලක්වැසි බෞද්ධයන් කෙරෙහි වෛරය නොව මෛත්‍රිය කෙරෙත්වා'' යි පතමි.

මීට , මෙතැති,
පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි,
ඥාණරතන භවනා මධ්‍යස්ථානය,
පෙළෙන්ගස්හේන,
දොම්පේ.
29.05.2015

ඇරෙන්නට වෙන කිසිම උදව්වක් ලැබුනේ නෑ. මේ දරුවන් තුන්දෙනාගේ නඩත්තුවට ලොකු වියදමක් යනවා. කිරිපිට ඉඳලා තවත් ගොඩක් දේවල් වලට මුදල් ඕනේ. ඒත් නෑ බෑ කියලා බැහැනේ. අපි කොහොම හරි අපේ දරුවෝ තුන්දෙනා ලොකු මහත් කරගන්න ඕනේ. මෙයාලට හොඳට උගන්වන්න ඕනේ. මේවා මට තනියම කරගන්න අමාරු නිසයි මම මේ විහට අපිට උදව්වක් කරන්න පුළුවන් කාගෙන් හරි උදව් ඉල්ලන්නේ. මේ දරුවෝ තුන්දෙනාම තනියෙන් බලාගන්නේ මගේ බිරිඳ. ඒ නිසා එයාට රැකියාවකට යන්න කොහොමටවත් බෑ. එයාගේ අම්මත් වෙලාවකට ඇවිත් දරුවන් බලාගන්නවා. ඒත් අම්මට දිගටම මෙහෙ ඉන්න බෑ මගේ අම්මත් අසනීපෙන් ඉන්නේ.

රාගම ඉහළගම 1095 කුලී නිවසේ තමයි මම පදිංචි වෙලා ඉන්නේ. මේ දරුවන්ට දවසක එයාලගෙම කියල ගෙදරක යන්න ලැබෙන එක මට තියෙන ලොකු හීනයක්. ඒ වෙනුවෙන් මම ගොඩක් මහන්සි වෙනවා. මහන්සි වෙලා හොයන හැම සතයක්ම වාගේ වියදම් වන්නේ මගේ දරුවන්ට. අපිටම කියලා ඉන්න තැනක් ලැබෙනවානම් ඒක ලොකු සැනසීමක්. මේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් කාටහරි උදව් කරන්න හැකියාවත් තියෙනවනම් ලොකු පිනක්. නිශ්ශංක අප හා වදන් මුසුකලේ දුක හමුවේ නිතැතින්ම උණුවන සිත් ඇති අපේ රටේ ජනතාව මෙවන් අවස්ථාවලදී තමන්ට හැකි කුමන හෝ උපකාරයක් කිරීමට පෙළඹෙන්නේ නිරායාසයෙනි.

දූන් ඔවුන්ට මේ වෙසක් සමයේ ඒ පුණ්‍ය කර්මයට දායක වීමට හැකියාවක් ලැබී ඇත. මේ කුඩා පැටවුන්ගේ හෙට දවස වෙනුවෙන් පුංචි උදව්වක් හෝ කළ හැකිනම් එය ඔවුන්ට විශාල සහනයක් වනු ඇත.

අපේ කාර්යාලයේ ඒ මේ අත දුවපනිමින් දඟකාරකම් කරන හුරතලුන්ට ගෙදර යන්නට වගේ වගක් නැත. එහෙත් ඔවුන් ඔවුන්ගේ නවාතැනට යායුතුය. අපද අපගේ නවාතැන්පලට යායුතුය. ඒ යන්නට මත්තෙන් ලියා තබන්නම් නැවතත් මෙසේ. ඔබගේ පුංචි උපකාරය වුවද ඔවුන්ට මහත් අස්වැසිල්ලක් වනු ඇත.



**ආර්.ජී.එම්.පී.ජී.එස්. න්ශ්ශංක**
**0726965352**

**කේ.එච්. ප්‍රේමලතා**
**0726429547**

**HNB ගිණුම් අංකය රාගම**

**හේමමාලා කුමාරි**
**සේයා රූ / සුමුදු හේවාපතිරණ**

**(දේශය 2015 මැයි 03 ඉරිදා)**


0719 850 841